


වහන්සේ සිත් සතන් තුළ නොමැකෙන චරිතයක් බවට පත් වී ඇත. උන් වහන්සේ එඩිතරය. කිසිවෙකුට හෝ කිසිවකට බය නැත. කලබලකාරී ය. එමෙන් ම බොහෝ සංවරශීලි ය. උන්වහන්සේගේ තිබුණු එක්තරා පුරුද්දක් වූයේ සුරුට්ටු ඉරීම ය. ඕනෑම අවස්ථාවක සුරුට්ටුවක් උරමින් සිටිනු අපට දැක ගත හැකි විය. එය රහසින් සැඟවී කළ දෙයක් නොවේ. පන්සල් බිමේ දී කවුරු හිටියත් එම පුරුද්ද උන් වහන්සේ නතර කළේ නැත. පන්සලට ගිලන්පස සහ දානය ගෙන එන විට උන් වහන්සේට සුරුට්ටු මිටියක් පූජා කිරීමට ද දායක පිරිස පසුබට වූයේ නැත. උන්වහන්සේ පළාතට අමිල මෙහෙවරක් කළ ස්වාමීන් වහන්සේ නමක් ලෙස පැවසිය යුතු ය.

උන්වහන්සේ ගැන සඳහන් කරන විට අතුර ආරෝග්‍යශාලාව පිළිබඳ නිරතුරුව සිහිපත් වේ. දැනට අතුර රෝහල පිහිටි ස්ථානය වෙනත් කිසියම් මධ්‍යස්ථානයක් කිරීමට යම් පිරිසක් උත්සාහ කළ අතර එයට ඉදිරිපත්ව එම කාර්යය අඩපන කොට රෝහල සඳහා ම එම ඉඩම ලබා ගැනීම පිණිස උන්වහන්සේ කටයුතු කළ ආකාරය පිළිබඳව එම සත් ක්‍රියාවට මහත්සේ දායක වූ දැනට අතුරේ ජීවත් වන, පළාතට විශාල මෙහෙවරක් කළ, කරන ඉන්ද්‍රරත්න වඩුගේ මහතාගේ වචන වලින් ම සඳහන් කිරීම යෝග්‍යයයි සිතමි.

''මිල්ලකන්ද වත්තේ ඉස්පිරිතාලෙ'' යනුවෙන් එවකට වතු සමාගමකට අයත්ව තිබුණු මෙම ඉඩම වෙනත් කිසියම් කටයුත්තක් සඳහා මධ්‍යස්ථානයක් වශයෙන් පිහිටුවීමට සිටින අවස්ථාවේ දී ඒ බවට මට ලැබුණු ආරංචියට අනුව මම ඒ ගැන කිසිවෙකුට නොදන්වන ලෙස තදින් ඉල්ලීමක් කරමින් එතැනින් පිටත් වුණේ ශ්‍රී බුද්ධ ඝෝෂාරාමාධිපති මීපිටියේ සෝමානන්දාභිධාන ලොකු හාමුදුරුවන් මුණ ගැහෙන්න. මේ විස්තරේ අහල උන්වහන්සේ පොලු පහරක් වැදුණු නාගයකු වගේ කිපුණා. උන් වහන්සේගේ උපදෙස් අනුව උන් වහන්සේත් සමග ම බුලත්සිංහල ශ්‍රී දේවමිත්තාරාමයට ගිහින් පන්සලේ ලොකු හාමුදුරුවො ඉඹුලේගොඩ සද්ධාතිස්ස ස්වාමින් වහන්සේවත් කැඳවාගෙන ආරච්චිගොඩට ගිහින් එතැන් සිටන් පයින් ගිහින් දෙල්මෑල්ලේ පුණ්‍යවර්ධනාරාමාධිපති මිල්ලෑවේ සරණතිස්ස ස්වාමීන් වහන්සේට ද ආරාධනා කරමින් අපි තුන්දෙනා අවට සියලු ම විහාරස්ථානවල ස්වාමීන් වහන්සේලා අලුයම වන විට එක් රැස්කර ගැනීමට අපට ශක්තිය ලැබුණා. මගේ මතකයේ හැටියට ස්වාමීන් වහන්සේලා විසිතිස් නමක් විතර වැඩ සිටිය. අපේ මේ ව්‍යාපාරය මෙම භූමියෙහි වෙනත් කිසිම සංවිධානයකට කිසිවක් පිහිටුවන්නට ඉඩ දෙන්නට බැරිය යි තදින් ම විරෝදය පාමින් හිටිය.

# හොඳට හොඳයි නරකට නරකයි



අතුර පරගොඩ පාරේ යන විට හමුවන එවකට බුලත්සිංහල පොලීසිය අද්දරින් ඇති ගුරු පාරෙන් ගොස් කඳු ගැටය මුදුනට නැගුණු විට තිනියගොඩැල්ල පන්සල හෙවත් ශ්‍රී බුද්ධ ඝෝෂාරාම විහාරස්ථානය හමුවේ.

කරල්දැක්මේ ජීවත් වූ අප ප්‍රධාන වශයෙන් සම්බන්ධ වූ, පිංකම් සඳහා නිතර ම ළඟා වූ පන්සල් දෙක වෙල්ගම පන්සල හා මෙම පන්සලයි. බොහෝ විට දර්ශනීය පෙරහැර සමඟ පින්කම් පවත්වන අතර ඒවා නැරඹීමට බුලත්සිංහල වටා සෑම ප්‍රදේශයකින් ම පිරිස එක්රැස් වෙති. එක්තරා පින්කමක් අවසානයේ පෙන් වූ "පිංගුත්තර" නාට්‍යය ගමේ පිරිස විසින් රඟපා පෙන් වූයේ මිදුල මැද ය.

**මිල්ලෑවෙ සරණතිස්ස ස්වාමීන් වහන්සේත්, ඉඹුලේගොඩ සද්ධාතිස්ස ස්වාමීන් වහන්සේත් එවකට අගලවත්ත මන්ත්‍රීව සිටි අනිල් මුණසිංහ මහතා හමු වී කොළඹ ගොස් එවකට අග්‍රාමාත්‍ය එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහතා හමු වී කරුණු සැල කිරීමෙන් පසුව අගමැති බණ්ඩාරනායක මහතාගේ විශේෂ නියෝගයක් මත මිල්ලකන්ද රෝහල සහිත ඉඩම රජයට පවරා ගැනීමට කටයුතු යෙදුණි.**

මෙම පන්සලේ අධිපති ස්වාමීන් වහන්සේ ලෙස වැඩ විසූ මීපිටියේ සෝමානන්ද ස්වාමීන්

මේ වන විට බුලත්සිංහල මැතිවරණ කොට්ඨාසයක් නොතිබුණු කාලය. බුලත්සිංහල අයත් වෙලා තිබුණෙ අගලවත්ත මැතිවරණ කොට්ඨාසයට යි. මිල්ලෑවෙ සරණතිස්ස ස්වාමීන් වහන්සේත්, ඉඹුලේගොඩ සද්ධාතිස්ස ස්වාමීන් වහන්සේත් එවකට අගලවත්ත මන්ත්‍රීව සිටි අනිල් මුණසිංහ මහතා හමු වී කොළඹ ගොස් එවකට අග්‍රාමාත්‍ය එස්.ඩබ්ලිව්.ආර්.ඩී.බණ්ඩාරනායක මහතා හමු වී කරුණු සැල කිරීමෙන් පසුව අගමැති බණ්ඩාරනායක මහතාගේ විශේෂ නියෝගයක් මත මිල්ලකන්ද රෝහල සහිත ඉඩම රජයට පවරා ගැනීමට කටයුතු යෙදුණා. එතුමාගේ නියෝගය මත ඒකට භාණ්ඩාගාරයෙන් මුදල් වෙන් කරපු බවත් අපට දැනගන්නට ලැබුණා.

එදා සවස් භාගයේ දී එවකට සිටි සෞඛ්‍යය උප ඇමති පී. බී. ජී. කළුගල්ල මහතාත් ටී.බී. තෙන්නකෝන් මහතාත් මිල්ල කන්ද රෝහල භූමියට පැමිණියා. මා කතාවක් කළා ඒ කටයුත්ත කෙසේ හෝ කළ යුතුයි කියා ඉල්ලීම කරමින්. අපට කීව කලබල කර ගන්නට එපා කියල. මම කීව කිසිම කලබලයක් නෑ මේ කටයුත්ත ඉස්ට වෙන්න ඕනෙ කියල. ඒ අනුව මට කලුගල්ල ඇමති තුමා එතුමගෙ නිල රථය ළඟට ඇවිල්ල දොර ඇරල ලිපි ගොනුවක් පෙන්නුව. එහි සඳහන් වුණා මිල්ලකන්ද රෝහල් ඉඩම රජයට පවරා ගැනීමට අගමැතිතුමාගේ විශේෂ නියෝගය පරිදි මුදල් වෙන් කළ බව දැන ගන්නට ලැබුණා.

ඊට දවස් හතරකට පමණ පසුව එවකට කළුතර සිටි ආණ්ඩුවේ ඒජන්ත තුමා එයාගේ නිල නිවේදනය පසුදා හැමතැනම ජනතාවට දැනගන්න විදියට කටයුතු කළා.''

මතු සම්බන්ධයි

**Qualified experienced Nurse**

available to look after
aged / disabled client
in their own home.

**Call 0448087401**